**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය**

# ලංසු සඳහා ආරාධනයයි

## කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ පැමිණීමේ සහ පිටවීමේ පිටත ආලින්දයේ කුලුනු මත ප්‍රචාරණ කටයුතු සඳහා නියෝජිතායතනයක් තෝරා ගැනීම

**ලංසු අංකය : SLTPB/PROC/2025/S/180**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) විසින් වසර තුනක (03) කාලයක් සඳහා කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි (BIA) මගී පර්යන්ත ගොඩනැගිල්ල 1 හි පැමිණීමේ හා පිටවීමේ පිටත ආලින්දයේ පිහිටි කුලුනු මත අධි - විභේදන (high - resolution) LED තිර මිලදී ගැනීම, සැලසුම් නිර්මාණය, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා පිළිගත් සහ සුදුසුකම් ලත් වෙළඳ ප්‍රචාරණ නියෝජිතායතන / සමාගම් වෙතින් මුද්‍රා, තැබූ යෝජනා කැඳවනු ලැබේ.

01. අභිලාෂී ලංසුකරුවන් සතුව පහත සඳහන් සුදුසුකම් සහ පළපුරුද්ද තිබිය යුතුය. (සුදුසුකම් නිර්ණායක)

- ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූලව ලියාපදිංචි වී තිබීම සහ එළිමහන් ප්‍රචාරණය, සන්නාම ප්‍රවර්ධනය හෝ ඒ ආශ්‍රිත අලෙවිකරණ කටයුතුවල අවම වශයෙන් වසර පහක (05) සනාථ කළ පළපුරුද්දක් තිබීම.
- **පෙර පළපුරුද්ද** : ඩිජිටල් ප්‍රචාරණ තිර ස්ථානය කිරීම, නඩත්තු කිරීම, සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව අවම වශයෙන් වසර පහක (5) සනාථ කළ පළපුරුද්ද තිබීම.
- පිළිගත් නෛතික තත්ත්වයක් තිබිය යුතුය. සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම (AASL) හෝ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) සමග අතීතයේ හෝ දැනට පවතින නීතිමය ආරවුල් / ගැටලු සහිත අයදුම්කරුවන් සලකා බලනු නොලැබේ. තමන් අසාධු ලේඛනගත නොවූ කර්මාන්තයේ යහපත් කීර්තිනාමයක් ඇති ආයතනයක් බවට ලංසුකරු විසින් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.
- පසුගිය අඛණ්ඩ වසර තුනක (03) (2021 - 2024) විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මගින් තහවුරු කරන ලද මූල්‍ය ස්ථාවරත්වය පෙන්නුම් කළ යුතුය.

කිසිදු හේතු දැක්වීමකින් තොරව ඕනෑම හෝ සියලුම යෝජනා පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සතු වේ.

02. ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2024 යටතේ ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය (NCB) මගින් ලංසුකරණය මෙහෙයැවේ.

03. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට Procurement@srilanka.travel වෙත ඉල්ලීමක් යොමු කිරීමෙන් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ කළමනාකාර අධ්‍යක්ෂ වෙතින් වැඩිදුර තොරතුරු'ලබාගත හැක.

04. අභිලාෂී ලංසුකරුවන් හට පහත දැක්වෙන විද්‍යුත් තැපැල් ලිපිනය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් සහ නැවත නොගෙවනු ලබන රු. 2,000/- (රුපියල් දෙදහසක් පමණයි) ගාස්තුවක් 2026.02.02 දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය නමින් තැන්පත් කිරීමෙන් / මාර්ගගතව ප්‍රේෂණය කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සැකසී ඇති ලංසු ලිපි ලේඛන සම්පූර්ණ කට්ටලයක් ලබාගත හැක. ගෙවීම් ලංකා බැංකුවේ, ආයතනික ශාඛාවේ පවත්වාගෙන යනු ලබන **ගිණුම් අංක** 007119985 ගිණුම වෙත ගෙවිය යුතු අතර, පහත සඳහන් තොරතුරු ද සමග ගෙවීම සහතික කිරීමේ ලදුපත Procurement@srilanka.travel යන විද්‍යුත් තැපැල් ලිපිනය වෙත එවිය යුතුය.

- නියෝජිතායතනයේ නම
- සම්බන්ධ කර ගත යුතු පුද්ගලයාගේ නම සහ සම්බන්ධතා තොරතුරු
- සම්බන්ධ කර ගත යුතු පුද්ගලයාගේ විද්‍යුත් තැපැල් ලිපිනය

05. අභිලාෂී ලංසුකරුවන්ට https://www.srilanka.travel/tender-documents වෙබ් අඩවියට පිවිසීමෙන් ගාස්තු ගෙවීමකින් තොරව ලංසු ලිපි ලේඛන පරීක්ෂා කොට බැලිය හැක.

06. මේ සම්බන්ධ පූර්ව ලංසු රැස්වීමක් 2026.01.23 දින ශ්‍රී ලංකාවේදී Google meet හරහා (meet.google.com/mvi-vtkv-gfb) පැවැත්වේ.

07. සියලුම ලංසු සමග ලංසු ලිපිලේඛනයෙහි ඇතුළත් ආකෘතියෙන් යුත්, ශ්‍රී ලංකා රුපියල් මිලියනයක (රු. 1,000,00) වටිනා කමින් යුත්, ලංසු භාරගැනීම අවසන් කරනු ලබන දිනයේ සිට දින 119 ක් දක්වා වලංගු, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි A ශ්‍රේණියේ වාණිජ බැංකුවක් විසින් කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවත, අංක 35, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, කළමනාකරණ අධ්‍යක්ෂ නමින් නිකුත් කරන ලද කොන්දේසි විරහිත ඉල්ලූවිට ගෙවන ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතුය.

08. ලංසු 2026.02.03 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, අංක 35, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 ලිපිනය වෙත ඉදිරිපත් කළ යුතුය. ලංසු භාරගැනීමේ කාලය අවසන් වූ වහාම ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේදී එම අවස්ථාවට පුද්ගලිකව පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් ලංසු විවෘත කරනු ලැබේ.

09. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. මෙම ප්‍රසම්පාදනය සඳහා ලංසු කැඳවීමේ හෝ ලංසු කැඳවීමේ අවලංගු කිරීමේ පූර්ණ අභිමතය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

11. ලංසු බහා එවන කවරයෙහි ඉහළ වම් කෙළවරේ "**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ පැමිණීමේ සහ පිටවීමේ පිටත ආලින්දයේ කුලුනු මත ප්‍රචාරණ කටයුතු සඳහා නියෝජිතායතනයක් තෝරාගැනීම**" යනුවෙන් සඳහන් කළ යුතුය.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය,**
**අංක 35, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.**